

ප්‍රබල කතාවක් - අබල බසකින්

භාෂාව යනු සාහිත්‍යකරුවා සතු එකම මාධ්‍යය යි. චිත්‍රයක් නිර්මාණය කරන සිත්තරා තමා අතට පත් වර්ණ සහ රේඛා ආදී මාධ්‍ය කිහිපයක් උපයෝගී කර ගනිමින් සිතුවමක් මවන්නාක් මෙන්, ලේඛකයා තමා අත ඇති එකම අමුද්‍රව්‍යය වන වචන උපයෝගී කර ගෙන සිය නිර්මාණය කරන්නේය. එය සාර්ථක ලෙස හසුරුවාලීම කෙරෙහි බොහෝ ලේඛකයන්ගේ අවධානය යොමු නොවීම හිතකර නොවේ.

මා මේ ලියන්නේ සම්මත පිළිවෙළ අනුගමනය කරන විවේචනයක් නොවේ. සාමාන්‍යයෙන් විවේචනයකින් අපේක්ෂා කරනුයේ සාහිත්‍ය කෘතියක් ඇගයීමය. තක්සේරු කීමය. එහි ලා වැදගත් හිතකර, අහිතකර ලක්ෂණ පෙන්වා දීමය. මුල් කොටසින් එසේ කිරීමට තැත් කරන අතර, දෙවෙනි කොටසින් පාඨකයා නොව ලේඛකයා සහ පොදුවේ සෙසු ලේඛකයන් ද අමතා ලියන්නට ය මා අදහස් කරන්නේ.

අපේ මව්බිමේ හමුදාව සහ කොටි අතර සටන පාදක කොට ගෙන ලියැවුණු සිංහල නවකතා ඇත්තේ ස්වල්පයක් පමණි. මා දන්නා හැටියට මුලින්ම ලියැවුණේ චන්ද්‍රරත්න බණ්ඩාර ගේ "වන සපුමල" ය. 1993 ඩී.ආර්.විජේවර්ධන අනුස්මරණ ප්‍රදානය හිමි කරගත් එම නවකතාව ඉංග්‍රීසියෙන් සහ දෙමළ බසින් ද පළ කරනු ලැබීය. ඇත්ත වශයෙන්ම මට කියවන්නට ලැබුණේ විජිතා ප්‍රනාන්දුගේ ඉංග්‍රීසි පරිවර්තනයයි. සටන මැද අතරමං වන යාපනයේ තරුණයෙකු-ගේ කතාව කියන එම නවකතාව හැරුණු විට සිංහලෙන් ලියැවුණු නවකතාවක් හැටියට මා දන්නේ මේ වසරේදී පළ වුණු මෙල්බන්වාසී විනිතා විජේරත්න ගේ "ගිනි අවියයි, රෝස මලයි" යන්නයි. එහි සටන ගැන බොහෝ දේ කියන්නට තැත් කළ ද නවකතාවක් වශයෙන් අසාර්ථක ව්‍යායාමයක් බව කිව යුතුය. සිඩ්නිවාසී සමන් මහානාම දිසානායකගේ නවකතාවක, සිංහල සෙබළෙකු සමග විවාහ වන කොටි කාන්තාවක සැමියාගේ මරණයෙන් පසු දරුවා ද රැගෙන ඔහුගේ දෙමාපියන් වෙත පැමිණ සිංහලයන් අතර ගත කරන අපූරු ජීවිතයක් විස්තර වෙයි.

ඉංග්‍රීසියෙන් නවකතා කිහිපයක් ලියැවී ඇති බව මම දනිමි. මෙල්බන්වාසී චන්න වික්‍රමසේකර ලියූ දෙවන නවකතාව වන "ඩිස්ටන්ට් චෝරියර්ස්" සහ දම්පහලගේ "හිම වටේ ගින්දර" යි යන දෙකම දුර තියා කරන සටන් ගැන කියන්නේය. දුරස්ථ සංග්‍රාම යනුවෙන් සිංහලෙන් දැක්විය හැකි චන්නගේ නවකතාවේ විස්තර වන්නේ දෙපිලට බෙදී මුහුණට මුහුණ දී සටන් කරන මෙල්බන්වාසී සිංහල දේශප්‍රේමීන් සහ කොටි හිතවාදීන් අතර සටනකි. දමින්ද විස්තර කරන සටන් ඊට වඩා සියුම් ආකාරයට, පිටතට නොපෙනෙන විදියට, හැංගි හොරා කරන, එක් අතකින් අරිටත් වඩා බියකරු යැයි කිව හැක්කකි.

චන්නගේ සටනේදී අණ දෙන නිලධාරියා ගොඩින් බෙරෙන අතර අහිංසක තරුණයෙක් නිකරුණේ දිවි නැති කර ගනියි. දමින්ද-ගේ චරිත අතර දිවි අහිමි කර ගන්නෙක් නැත. එහෙත් ඊට වඩා බරපතල විදියට මුළු දිවියම නාස්ති කරගන්නා දෙමළ හා සිංහල චරිත ඔහු-ගේ නවකතාවේ එයි.

මෙහි කථකයා ඩොම් යන නමින් තමන් හඳුන්වා ගන්නා ශ්‍රී ලංකාවේ සරසවියකට පිවිසීමේ වරම අහිමි වූ පසු දෙමාපියන් විසින් අමාරුවෙන් උසස් අධ්‍යාපනය සඳහා ඕස්ට්‍රේලියාවට යවනු ලබන මැද පංතියේ තරුණයෙකි. වසරක් ඇවෑමෙන් අධික විදාශල ගාස්තු ගෙවා ගන්නට අපොහොසත් වූ ඔහු සෑම් නම් තවත් එබඳු තරුණයෙකු සමග චමරියක වාසයට යයි. සෑම් විදුහලක උගන්නා බව පෙන්වමින් පූර්ණකාලීන රැකියාවක නිරත වූවෙකි. සෑම් විසින් ඉතිරි කරන ලද මුදලකින් විදුහල් ගාස්තු ගෙවීමට සමත් වුව ද ඩොම්ගේ ද අධ්‍යාපනය කඩාකප්පල් වෙයි.

සැප පහසුවක් නැති වුව ද සෑම් සමග වාසය කරන ඩොම්ට එහි නිවැසි සිවා නම් දෙමළ තරුණයා මුණ ගැසෙන්නේද කලාතුරකිනි. සෑම් එතැනට කැන්දන් ආවේ ද සිවාය. සිවා සහ සෑම් එක කුස උපන් සොහොයුරන් මෙන් කුළුපගව සිටින්නෝ ය. කොටින්ට එරෙහිව සටනට ගොස් මිය ගිය හමුදා නිළධාරීන්ගේ දරුවෝ කිහිප දෙනෙක් ද මෙල්බන්හි වාසය කරති. ඔවුන්ගේ අරමුණ වනුයේ කොටින්ට ආධාර දෙන දෙමළ මිනිසුන් පිළිබඳ තොරතුරු සොයමින්, නීති විරෝධී ලෙසින් වීසා රහිතව මෙහි සිටින දෙමළ මිනිසුන් ආගමන දෙපාර්තුමේන්තුවට අල්ලා දීමය. සෑමගේ මාර්ගයෙන් අහම්බෙන් වාගේ සිවා හමු වන මොවුන්ගෙන් එකෙක් සිවා අර විදියට මුදල් යවන්නෙකු වශයෙන් හඳුනා ගෙන ඔහු පිටුවහල් කරවීමට සමත් වෙයි. ඩොම් ඉදිරියේම සමාජ ශාලාවක දී සෑම් විසින් බෝතලයකින් පහර දෙනු ලබන්නේ යට කී ඔත්තුකාරයා ය.

එහෙත් සිවා සැක කරන්නේ තමාගේ හොඳම යාළුවා විසින් මෙම අපරාධය කරන ලද බවය. ශ්‍රී ලංකාවේ සිට ඔහු සෑමට එරෙහිව ක්‍රියා කරන්නේය. සෑම් මේ අතර ඩොම්ට පැහැදිලි කර දෙන්නේ සිවා කොටින්ට මුදල් යවන්නේ තම සහෝදරයින් දෙදෙනා කොටි හමුදාවට බඳවා ගැනීම වලක්වා ගැනීමට ඇති එකම මග හැටියට බවය. සිවා ගේ මේ වචන සෑම් ට විශ්වාස ය.

සෑම් රටින් පිටුවහල් කිරීමෙන් අනතුරුව තමාටත් පුරවැසි අයිතිය නැති නිසා වීසා කාලය අවසානයේ ඩොම් ආපසු ශ්‍රී ලංකාවට එන්නේ ලබා ගත් උපාධියක් රහිතව ය. එහෙත් ඉංජිනේරුවකු වශයෙන් පියා ඉදිරියේ පෙනී සිටින සිය මිතුරා සෑම් මෙන්ම ඔහුටත් බොරු මුහුණක් බැඳ ගැනීමට සිදු වෙයි. එසේ ආපසු අවුත් සෑම් මුණ ගැසී ඔහුගෙන් ලබා ගත් ණය මුදල ගෙවීමට යන ඩොම් සිවාගේ විරෝධය සහ ක්‍රියාව අනාවරණය කර ගන්නේ ඒ මොහොතේය.

මේ අනාවරණයෙන් කතාව අවසන් කළා නම් එයින් ඉදිරිපත් වන පණිවුඩය වඩා සාර්ථ ක අයුරින් ප්‍රකාශ වන බවයි, මට සිතෙන්නේ. අවසන් පිටුවේ (අංක 104) තමා හමුදාවට බැඳීම ගැන කීමට කථකයා සිතීම නිසා ඒ අදහස ඇල් මැරෙන සැටියකි, මා දකින්නේ.

දමින්ද දම්පහල කෙරෙන් පෙනී යන කුසලතාවක් ඇතැයි මම පසුගිය කස්තිරමෙන් ඔහුගේ කෙටිකතාව ගැන කියමින් සඳහන් කළෙමි. සිය පළමු නවකතාව ඔස්සේ ඔහු ඒ බව යළිත් ස්ථිර කර ඇත.

මගේ විවේචනයට, දෙවෙනි කොටසට ප්‍රවේශයක් වශයෙනි අබල බසක් යන්න කීවේ. ශ්‍රී ලංකාවට ගිය විට මට ලැබුණු නව කතාවක් ඇත. "රන් බණ්ඩලාගේ ලෝකය" නම් වූ එය රචනා කරන ලද්දේ සුනිල් එල්.ආර්.බණ්ඩාර ය. ඔහු සම්මානලාභී නව කතාකරුවෙකි. පළපුරුදු ලේඛකයෙකි. ඔහු පවා මා කියන අබල බසින් ඈත් වූවෙක් නොවේ. කැළණිය සරසවියේ උපාධිධරයෙක් යැයි සිතිය හැකි එම ලේඛකයා වෙතින් ද ප්‍රකාශ වන්නේ අද බොහෝ උපාධිධරයන්ටවත් සිංහල වාක්‍යයක් ගලපා ගන්නට බැරි බව ය. මෙය ඕස්ට්‍රේලියාවාසී සිංහල උපාධිධරයන් බොහෝ දෙනෙකුගේ දුබලතාවක් බව ද කියමි.

භාෂාව යනු සාහිත්‍යකරුවා සතු එකම මාධ්‍යය යි. චිත්‍රයක් නිර්මාණය කරන සිත්තරා තමා අතට පත් වර්ණ සහ රේඛා ආදී මාධ්‍ය කිහිපයක් උපයෝගී කර ගනිමින් සිතුවමක් මවන්නාක් මෙන්, ලේඛකයා තමා අත ඇති එකම අමුද්‍රව්‍යය වන වචන උපයෝගී කර ගෙන සිය නිර්මාණය කරන්නේය. එය සාර්ථක ලෙස හසුරුවාලීම කෙරෙහි බොහෝ ලේඛකයන්ගේ අවධානය යොමු නොවීම හිතකර නොවේ.

මගේ උපදෙස් බාර ගන්නැයි කිසිවකුට බල කිරීමේ හැකියාවක් හෝ අයිතියක් මට නැත. එහෙත් මා සිතන ආකාරයට ඉදිරියට යාමට සමත් ලේඛකයෙකු දුටු විට ඔහුට දිය හැකි උපදෙසක් දීම මගේ යුතුකමකැයි සිතමි. මා මෙය ලියන්නේ දමින්ද දම්පහලගේ මෙයින් ප්‍රයෝජනයක් ගනු ඇතැයි බලාපොරොත්තුවෙනි. අනෙක් ලේඛකයන්ගේ හිත සුව පිණිස විය හැකි බව ද කියමි.

නිවැරදි ඉංග්‍රීසි ලිවීමට අසමත් ශිෂ්‍යයන්ගේ දැනුම හා හැකියාව වැඩි දියුණු කළ යුතු යැයි කල්පනා කරන ඕස්ට්‍රේලියාවේ රජය විසින් ඒ සඳහා ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙලක් දියත් කරන බව පසුගිය දා වාර්තා විය. සිංහල රාජ්‍ය භාෂාව වශයෙන් ද සලකන ශ්‍රී ලංකාවේ බස ගැන ඒ වගේ උනන්දුවක් පළ කරන අධිකාරීන් හෝ විද්වතුන් ඇති බවක් දක් නට නොලැබෙයි.

එහෙත් මේ අවශ්‍යතාව අවබෝධ කරගෙ න තමා උපයෝගී කර ගන්නා අගනා මාධ්‍යය හසුරුවාලීමේ සමත්කමක් ලබා ගැනීම අප සමග සිටින ලේඛකයන් විසින් නොතකා හැරීමට එය හේතුවක් නොවිය යුතුය. දම්පහලගේ ලියන බසෙහි ඇති සාවද්‍ය තැන් කිහිපයක් දක්වමි.

- මා නැවත වැඩ මුරයක යෙදේ.
- වෙරළ දිසේ මිනිසුන් ඇවිදී.
- මා පිළිතුරු දුනි.
- මා ශාලාවට ඇතුළු වීමි.
- ඇය විදුරුව පිසින්නට විය.
- අප දෙදෙනා බාර් එක දෙසට ඇදුණි.

මෙබඳු නිදසුන් පිටුවක් ගානේම වාගේ සොයා ගත හැකිය. මා දමින්දට දොස් කියන්නේ, මෙය ඔහු පමණක් කරන වරදක් නොවන බව දැන දැන ය. එහෙත් අනෙක් පළපුරුදු ලේඛකයන් අනුගමනය කරමින් ඔවුන් කරන වැරදි ම කිරීම දියුණු වන ලේඛකයෙකු විසින් නොකළ යුත්තක් බව කියමි.

ණ න ළ ල භේදය ගැන කොතරම් කතා කළත් ඒ භේදය තව කලක් යන විට අමතක ව යන බව මගේ විශ්වාස කරමි. අනෙක් අතට සන්ධි, සමාස හෝ විකෘති බඳු වියරණ විදි හෝ නිපාත නිපාත, උපසර්ග ගැන පවා දැනගත යුතු යැයි නොකියමි. එහෙත් භාෂාවක් භාවිතා කරන්නා ඒ බසින් මූලික වියරණ අනුව සරල වැකියක්වත් ලිවීමට නම් සමර්ථ විය යුතු බව කියමි.

ඒ සඳහා අවශ්‍ය වන්නේ උක්තාඛ්‍යාත සම්බන්ධයත්, උක්තානුක්ත භේදයත් වටහා ගැනීම පමණි. එය වටහා ගැනීම මහා රාජකාරියක් නොවන බවත් කියමි.

කට වහරේ එන යෙදුම් සිය රචනාවෙහි ලා උපයෝගී කර ගැනීමේ රුචියක් දම්පහල වෙතින් ප්‍රකාශ වීම මම අගය කරමි. එසේ යොදා ගන්නා ව්‍යවහාර, සැක හැර දැන ගැනීම උචිත බවත් කියමි. ඉංග්‍රීසි වචන තම ලේඛනයට ඇතුළත් කිරීම අවශ්‍ය විය හැකිය. එහෙත් එයත් සංයමයකින් කළ යුතු බව ද සඳහන් කළ යුතු ය.

ඩී.බී.කුරුප්පු